# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 1578/14 - 2008 දෙසැම්බර් 02 වැනි අඟහරුවාදා - 2008.12.02

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ ගාල්ල මහ නගර සභාවේ නගරාධිපති ධූරයේ පුරප්පාඩුව පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන ගාල්ල මහ නගර සභාවේ නගරාධිපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65 අ (1) වැනි වගන්තිය යටතේ, නගරාධිපති වන වීරනාරායන සෙනෙවිරත්න කැළුම් නම් වූ නගරාධිපති අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත නගරාධිපති වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ ගාල්ල මහ නගර සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා අ. අ. ඇලෙක්සැන්ඩර් මෛත්සිරි ද සිල්වා මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

ගාල්ල මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි අන්තෝනි බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අ.අ. ඇලෙක්සැන්ඩර් මෛත්සිරි ද සිල්වා මහතා ගාල්ල මහ නගර සභාවේ නගරාධිපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. බී. අයි. ද. සිල්වා,
තේරීම්භාර නිලධාරි,
ගාල්ල මහ නගර සභාව.

2008 නොවැම්බර් මස 27 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

12-497

1A - G 010510— 445 (2008/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.